නෝර්ත්සී ලිමිටඩ් (NSL)

(ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පවතින සමාගමකි)

පුරප්පාඩු

01. කර්මාන්ත සඳහා කළමනාකරු තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව : 03 තුනයි)

සේවා ස්ථානය : ලුණුවිල, වීරවිල සහ යාපනය

වැටුප් පරිමාණය : MM 1-1 2016 - II ශ්‍රේණිය රු. 53,175 - 10X1375-15X1910- රු. 95,575/-

වයස : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාවේදී (BSc) ඉංජිනේරු (යාන්ත්‍රික) ක්ෂේත්‍රයේ උපාධියක් **සහ**

   පූර්ව උපාධිය ලබා ගැනීමෙන් පසු ලත් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් (01) වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීයවේදී ඉංජිනේරු ආයතනයක අවසාන මට්ටම් පරීක්ෂණය සමත්වීම හා තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක අවම වශයෙන් එක් (01) වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

අභ්‍යන්තර අපේක්ෂකයින් : (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින්ට අදාළ හා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකරු විධායකශ්‍රේණියේ (JM1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

පත්වීම්වල ස්වභාවය :

ඉහත සඳහන් තනතුර ස්ථිර පදනම මත පිරවෙනු ඇති අතර, වසර තුනක (03) ක පරිවාස කාලසීමාවකට යටත්ව EPF (සේවක අර්ථසාධක අරමුදල) හා ETF (සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල) ට හිමිකාරිත්වය දරනු ඇත.

පොදු කොන්දේසි

- අනවද්‍ය හා විශිෂ්ට චරිත ස්වභාවයකින් යුත් සේවයට සුදුසු වන රාජකාරී මනාවින් ඉටුකිරීමට සමත්, කායික හා මානසික යෝග්‍යතාවයෙන් හා නිරෝගීතාවයෙන් යුත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයින් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අත්දැකීම් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවයක් දෙනු ඇත. අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් සිය පූර්ණ ජීව දත්ත තොරතුරු සහිත (CV) සමඟ හා ඥාති නොවන නිර්දේශකයින් (02) දෙදෙනෙකුගේ නම් හා විද්‍යුත් ලිපින ද ඇතුළත් අධ්‍යාපනික/ වෘත්තීයවේදී සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රවල සහතික කළ පිටපත් හා සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟින් 2021 මාර්තු මස 15 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 10, D. R. විජේවර්ධන මාවත, අංක 450 හි නෝර්ත්සී ලිමිටඩ් හි සභාපති වෙත ලේඛනගත (රෙජිස්ටර් කළ) තැපෑලෙන් එවිය යුතු වන අතර, අයදුම්පත් එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අයදුම් කරන තනතුර"** පැහැදිලිව සටහන් කළ යුතුය.

සභාපති,
නෝර්ත්සී ලිමිටඩ් (NSL)

Source: Dinamina, Daily News (2021.03.01)